පන්විල ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 21 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පන්විල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | රු.9,800,000 ක් වටිනා ඉඩම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. | ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි. |
| (ii) | 2012 වර්ෂයේදී හුළුගහ නැරඹුම් මැදිරිය ඉදිකිරීමට දරා තිබුණු රු.1,190,406 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. | ඊළඟ වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුස්තකාල පොත් ගිණුමේ ශේෂය හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂය අතර, රු.42,197 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීම් කළ යුතුවේ. | නොසැසඳීම් පිළිබඳව පිළිතුරු එවමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වසර 5 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.2,062,326 ක් වී තිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග ගනිමි. |
| (ii) | වසර 5 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.2,610,914 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ශේෂය තවදුරටත් පවතින බව වාර්තා කරමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | | | |
| | (i) 126 (vii) ඊ හා (xxx) උපවගන්ති | දැන්වීම් පුවරු ගාස්තු රු.328,086 ක් අයකරගෙන නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කළ යුතුවේ. | අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| | (ii) 149 වගන්තිය | සංචාරක මණ්ඩලයට ඉදිරිපත් කරන ගිණුම් කට්ටලය ලබා නොගැනීම හේතුවෙන් අයකර ගතහැකි ආදායමක් සභා අරමුදලට අහිමි වී තිබුණි. | සංචාරක මණ්ඩලයට ඉදිරිපත් කරන ගිණුම් කට්ටලය මත ආදායම් අයකර ගැනීම කළ යුතුවේ. | වරලත් ගණකාධිකාරීවරයෙකු විසින් සහතික කරන ලද ගිණුම් කට්ටලය මත ආදායම් අය කිරීමට කටයුතු කර ඇති බව දන්වමි. |
| (ආ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 10 ඡේදය | කඩ කාමර අතුරු බදු දිය නොහැකි වුවත් කඩ කාමර 15 ක් අතුරු බදු දී තිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,675,644 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,648,584 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,488,000 | 1,493,076 | 1,377,915 | 446,318 | 1,438,000 | 1,491,634 | 1,316,746 | 379,104 |
| (ii) | කුලී | 1,228,800 | 1,124,650 | 1,103,907 | 66,915 | 1,077,571 | 1,113,528 | 1,106,580 | 42,751 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,845,250 | 3,077,965 | 3,026,965 | 72,000 | 2,226,000 | 2,978,946 | 2,941,946 | 37,000 |
| (iv) | වෙනත් ආදායම් | 2,416,600 | 3,209,775 | 1,007,405 | 2,612,269 | 1,119,800 | 2,273,795 | 1,397,710 | 1,055,090 |
| | | 7,978,650 | 8,905,466 | 6,516,192 | 3,197,502 | 5,861,371 | 7,857,903 | 6,762,982 | 1,513,945 |

2.2.2 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.10,419,411 ක් වුවද, වර්ෂය තුළ රැස් කරන ලද ආදායම රු.6,516,192 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 62 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | පිළිගනිමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උසාවි දඩ රු.631,550 ක් හා මුද්දර | අදාළ මුදල් ගෙන්වා | හිඟ මුදල් ලබා ගැනීම සඳහා |

| | | |
|---|---|---|
| ගාස්තු රු.883,700 ක් ලැබිය යුතුව තිබුණි. | ගැනීමට කටයුතු කළ යුතුවේ. | උපලේඛන ප්‍රධාන ලේකම් වෙත යොමු කර ඇත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 18 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | සභාවට ආදායම් උපයාගතහැකි අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතුවේ. | කඩිනමින් පිළිතුරු සකස් කර එවීමට කටයුතු කරමි. |

(ආ) ප්‍රතිපාදන නොසැලසීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් අයවැය මඟින් ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම ඉටු කිරීමට හැකිවන පරිදි අයවැය පිළියෙල කළ යුතුවේ. | කඩිනමින් පිළිතුරු සකස් කර එවීමට කටයුතු කරමි. |

(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come)ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හුළුගහ මාළු කඩය 2017 වර්ෂයේ සිට වසා දමා තිබුණි. | භාවිතා කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී විකල්ප වෙළඳාමක් සඳහා ටෙන්ඩර් මඟින් බදු දීමට 2018 දෙසැම්බර් 03 වන දින පුවත්පත් දැන්වීමක් පළකරන ලදී. |

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රදේශවලින් දිනකට ටොන් 01 ක කසළ ප්‍රමාණයක් එකතු කරන අතර, නොදිරන කසළ හාතලේ මොරහෙල ඉඩම හා හුළුගහ සෙන්ජෝන්ස් හීල් ඉඩමට විධිමත් ක්‍රමවේදයකින් තොරව බැහැර කෙරේ. මෙම ඉඩම් දෙක අධික බෑවුම් සහිත බැවින් කසළ බැහැර කිරීම නායයෑම වැනි ස්වභාවික අනතුරුවලට හේතුවන අතර නකල්ස් රක්ෂිතය ආශ්‍රිතව කසළ බැහැර කිරීම පරිසර දූෂණයට මූලික හේතුවක් වී තිබුණි. | කසළ කළමනාකරණය විධිමත් කිරීමට කටයුතු කළයුතු වේ. | මධ්‍යම පරිසර අධිකාරියෙන් ඉඩමක් ගැනීම සඳහා නිර්දේශය ලබාගත් පසුව ඉඩම ලබා ගැනීමට කටයුතු කළ හැකි අතර එවිට කසළ බැහැර කිරීම වඩාත් විධිමත් වනු ඇත. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | කඩිනමින් පිළිතුරු සකස් කර එවීමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු කඩ කාමර 30 ක් සඳහා 2009 වර්ෂයේ තක්සේරුව ක්‍රියාත්මක කර නොතිබූ අතර, සභාවට රු.1,416,500 ක ආදායමක්ද 2016 වර්ෂයේ කළ තක්සේරුව ක්‍රියාත්මක නොකිරීමෙන් රු.1,573,000 ක ආදායමක්ද අහිමි වී තිබුණි. | තක්සේරු බද්ද කුලී අය කිරීමට කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන කොමසාරිස්ගේ 2017 පෙබරවාරි 25 දිනැති ලිපිය අනුව තක්සේරුව තාවකාලිකව අත්හිටුවන ලෙස දැනුම් දී ඇත. ඒ අනුව 2018 මූල්‍ය වර්ෂය තෙක් අදාළ තක්සේරුව ක්‍රියාත්මක නොකරන ලදී. |
| (ආ) | සභාව සතු බිම් කට්ටි 08 ක් සඳහා 2018 තක්සේරුව මත ගිවිසුම්ගත වීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු බද්ද කුලී අය කිරීමට කටයුතු කළ යුතුවේ. | පවතින ගැටලු සභාවට ඉදිරිපත් කර නිරාකරණය කර ගැනීමට අපේක්ෂා කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවක පුරප්පාඩු 3 ක් විය. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරමි. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.24,880,000 ක් වටිනා වාහන 02 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | මෙම වාහන උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. | රියදුරන් නොසිටි බැවින් භාවිතයට නොගන්නා ලද අතර, රියදුරන් බඳවා ගැනීමට මූලික කටයුතු කර ඇත. ආදායම් උත්පාදනය සඳහා යොදාගනිමින් පවතින බව වාර්තා කරමි. |

3.4.2 වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | එක් නිලධාරියකු එක් දිනක එකම වේලාවකදී වාහන 02 ක කිලෝමීටර් 417 ක් භාවිතා කර තිබුණි. | කළමනාකරණය විසින් අවශ්‍ය පියවර ගත යුතුවේ. | ඉදිරියේදී මෙවැනි වැරදි වළක්වා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | රාජකාරී කටයුතුවලින් බැහැර සභාවේ කැබ්රථය දින 48 කදී කිලෝමීටර 4341 ක් ධාවනයේ යොදවා ඉන්ධන සඳහා රු.45,821 ක් වැයකර තිබුණි. | රාජකාරී වලින් පරිබාහිරව වාහන භාවිතා නොකළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි වැරදි වළක්වා ගැනීමට කටයුතු කරමි. |

3.5 ප්‍රසම්පාදනය

3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල නොකර රු.1,181,796 ක භාණ්ඩ හා සේවා මිලදීගෙන තිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී එවැනි අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| හුළුගහ නැරඹුම් මැදිරියේ ප්‍රධාන පිවිසුම් මාර්ගයේ ආරක්ෂිත බැම්ම රු.1,472,704 ක් වැයකර වැඩ නිමකර තිබූ නමුත් මෙම ආරක්ෂිත බැම්ම පුපුරා ඇලවීම නිසා කඩාගෙන යාමේ අවදානමක් පවතී. ඒ තුළින් දේපළ හා ජීවිත හානි සිදුවීමේ අවදානමක්ද පැවතුණි. | ඉදිරිකිරීම් ප්‍රමිතියට සිදු කළ යුතුවේ. | ඇස්තමේන්තුවක් පිළියෙල කර නොමැති අතර, විගණනය විසින් අලාභය රු.1,472,704 ක් ලෙස පෙන්වා දුන්නද බැම්ම කොටස් 3 කින් යුතුව ඉටුකළ බැවින් දැනට ඇලවී ඇති බැම් කොටසේ වියදම රු.515,789 ක් බව ඉංජිනේරු මහතා දන්වා ඇත. තාක්ෂණික හා ඉංජිනේරුමය උපදෙස්වලින් තොරව පස් පිරවීම හේතුවෙන් බැම්ම ඇල වූ බව ඉංජිනේරු මහතාගේ මතයයි. |